# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1712/18 - 2011 ජුනි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2011.06.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 217 වැනි වගන්තිය සමග කියවිය යුතු එහි 212 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග :-

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2011 ජුනි මස 30 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ.

නියෝග

2007 මාර්තු මස 05 වැනි දිනැති අංක 1487/3 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 2006 අංක 1 දරන බලයලත් නියෝජිතයින් අනුමත කිරීම පිළිබඳ නියෝගයෙහි අංක 04 දරන අයිතමයේ (ඉ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීම මගින් එකී නියෝගය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(ඉ) (i) පහත සඳහන් සුදුසුකම්/තත්වය හිමි කර ගෙන ඇත්නම්,

(අ) වරලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික/අන්තර් සහතික පත්‍රය ;

(ආ) පිරිවැය කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ වෘත්තීය පියවරෙහි I කොටස/පිරිවැය සහ කළමනාකරණ වරලත් ආයතනයේ අන්තර් විභාගය ;

(ඇ) සහතික ලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ වෘත්තීය විභාගයේ I කොටස ; හෝ

(ඈ) ගණකාධිකරණ තාක්ෂණවේදීන්ගේ සංගමයේ සාමාජිකත්වය දැරීම ; සහ

(ii) සුදුසුකම් ලැබීමෙන් පසු ගිණුම්කරණය පිළිබඳව යටත් පිරිසෙයින් වසර දහයක පළපුරුද්ද සහිත වීම."

07-381


1A - G 14726— 1860 (2011/06)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.